# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1030/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 19/06/2024 පැය 2250

## මාධ්‍ය නිවේදනය

### පොලිස් පවුල් සුභ සාධක සංගමය මඟින් පාලනය වන පෙර පාසල් ත්‍රිත්වය විසින් සංවිධානය කරන ලද පොසොන් බැති ගී ප්‍රසංගය හා ත්‍යාග ප්‍රධානෝත්සවය.

2024 පොසොන් උත්සවයට සමගාමීව පොලිස් පවුල් සුභ සාධක සංගමය මගින් පාලනය වන ටයිනි ටොට්ස් යන පෙර පාසල් ත්‍රිත්වය මඟින් සංවිධානය කරන ලද පොසොන් බැති ගී ප්‍රසංගය 2024 ජූනි මස 19 වන දින පස්වරු 03.00 කොළඹ 07 පිහිටි අපරාධ වාර්ථා කොට්ඨාසයේ ශ්‍රවණාගාරයේදී පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් පොලිස් පවුල් සුභ සාධක සංගමය හා පොලිස් සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනි නීතිඥ අනුරාධා විජයවර්ධන මැතිණියගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

මෙහිදී, මෙවර පැවැත්වූ අ.පො.ස උසස් පෙළ විභාගයෙන් අපරාධ වාර්තා කොට්ඨාසයේ රාජකාරි කරනු ලබන පොලිස් පරීක්ෂක නිමල් පියතිස්ස නිලධාරියාගේ පස්නිවුන් දරුවන් විශිෂ්ට ලෙස සමත්ව සරසවි වරම් දිනා ගෙන තිබේ. මෙම දරුවන් ඇගයීමට ලක් කරමින් පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා සහ පොලිස් පවුල් සුභසාධක සංගමයේ සභාපති අනුරාධා විජයවර්ධන මැතිණිය විසින් ඔවුන් වෙත විශේෂ ත්‍යාග පිරිනැමීමක් සිදු කරන ලදී.

මෙම දරුවන් පෙර පාසැල් අධ්‍යාපනය පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ පිහිටි ටයිනි ටොට්ස් පෙර පාසලෙන් හදාරා ඇති අතර පිරිමි දරුවන් දෙදෙනා කොළඹ රාජකීය විද්‍යාලයෙන් සහ ගැහැණු දරුවන් තිදෙනා කොළඹ විශාකා විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය හදාරා ඇත.

එමෙන්ම පසුගිය දින කිහිපය තුල දිවයිනට බලපෑ අයහපත් කාළගුණය හේතුවෙන් අපදාවට ලක්වී පීඩාවට පත් පොලිස් නිලධරයන් උදෙසා මූල්‍ය ආධාර පිරිනැමීම ද පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුවිය.

අයහපත් කාළගුණය හේතුවෙන් දේපල වලට වූ හානි සහ අධ්‍යාපනය හදාරනු ලබන දරු දැරියන්ගේ ඉගෙනුම් සම්පත් වලට සිදුවූ හානි සලකා බලා පොලිස්පතිතුමාගේ උපදෙස් පරිදි පොලිස් ත්‍යාග අරමුදලෙන්, පොලිස් පවුල් සුභසාධක සංගමයෙන් හා පොලිස් මධ්‍යම සුභසාධක යෝජනා ක්‍රමයෙන් එම නිලධාරීන් උදෙසා මූල්‍යාධාර වෙන් කරන ලදී.

මේ යටතේ එක් නිලධරයෙකුට රු 10000/= බැගින් නිලධරයන් 95 දෙනෙකු සඳහාද, රුපියල් 5000/= බැගින් නිලධරයන්ගේ දරුදැරියන් 59 දෙනෙකු සඳහාද මූල්‍ය ආධාර පිරිනැමිණි.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්




2024-06-19











මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.